# බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2014 (2015)

## (03) අභිධර්මය

කාලය පැ. 3 යි.

**( I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.)**

### I කොටස

01. i. සතර පරමාර්ථ ධර්ම පිළිවෙළින් නම් කරන්න.

ii. අකුසල වචී කර්ම පිළිවෙළින් නම් කරන්න.

iii. විරති චෛතසික පිළිවෙළින් නම් කරන්න.

iv. අ) අභිධර්මයේ එන " රූප පරමාර්ථයේ " මූලික ලක්ෂණය පෙන්වා දෙන්න.

ආ) මහා භූත රූප සංඛ්‍යාව හා උපාදාය රූප සංඛ්‍යාව වෙන වෙනම පිළිවෙළින් දක්වන්න.

v. " ගෝචර රූප (විෂය රූප) යන්න හඳුන්වා, එහි සිවු වැදෑරුම් ප්‍රභේද නම් කරන්න.

vi. සමථ භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵල තුනක් පෙන්වා දෙන්න.



Scanned by CamScanner

vii. මධුපිණ්ඩික සූත්‍රය අනුව "තිණ්ණං සංගති ඵස්සෝ" යන පාඨයට අදාළව ශබ්දමය ඵස්සයක් හෙවත් ස්පර්ශයක් ඇතිවීමට හේතු වන සාධක තුන නම් කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

viii. සෝවාන් ඵලයට පත් පුද්ගලයා විසින් ප්‍රහීණය කෙරෙන සංයෝජන ධර්ම පිළිවෙළින් දක්වන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

ix. උද්ධංගීය සංයෝජනයක් වන " මානයේ " තෙවැදෑරුම් ප්‍රභේද හඳුන්වන්න.දෙපනස් චෛතසික නම් කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

x. අඤ්ඤසමාන චෛතසික කීයද ඒ මොනවාද?.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

* * *



Scanned by CamScanner

# බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2014 (2015)

## (03) අභිධර්මය

කාලය පැ. 3 යි.

( ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### II කොටස

02. i. අ) " පරමත්ථ දේසනා" හා "වෝහාර දේසනා" අතර වෙනස පැහැදිලි කරන්න.
ආ) වෝහාර දේසනාවට අදාළ ලක්ෂණ දෙකක් දක්වන්න.
ii. අට්ඨසාලිනී නම් වූ ධම්මසංගණී අටුවාවට අනුව අභිධර්මයට අදාළ නිධාන දෙක නම්කරන්න.
එක් එක් නිධානයට උදාහරණ වශයෙන් බෝසත් සිරිතෙන් හා බුදු සිරිතෙන් උපුටාගත් උදාහරණ අවස්ථා දෙක බැගින් දක්වන්න.
iii. ථෙරවාදී විභජ්ජවාදී අභිධර්ම සම්ප්‍රදාය පිළිබඳව මූලික කරුණු ඇතුළත් වන සේ හැඳින්වීමක් කරන්න.

03. i. අ) " සම්මුති සත්‍යය" හා " පරමාර්ථ සත්‍යය" අතර වෙනස දක්වමින් හැඳින්වීමක් කරන්න.
ආ) පරමාර්ථ ධර්ම අතුරින් පළමු පරමාර්ථය පිළිබඳව හැඳින්වීමක් කරන්න.
ii. " සංඛත " යන්න හඳුන්වා එයට ආවේණික වූ තුන් වැදෑරුම් ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
iii. " සබ්බේ ධම්මා අනත්තාති " යන්න උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

04. i. අ) අකුසල සිත් පිළිබඳව මූලික කරුණු ඇතුළත් වන සේ හැඳින්වීමක් කරන්න.
ආ) මෝහ මූලික සිත් දෙක ලියන්න.
ii. ප්‍රාණඝාත අකුසලයක් කර්ම පථයක් වීම සඳහා සම්පූර්ණ විය යුතු කරුණු විස්තර කරන්න.
iii. " ද්වේෂ මූලිකව කටයුතු කරන පුද්ගලයා දෙලොව පිරිහීමට පත් වේ". යන්න උදාහරණ සහිතව විමසන්න.

05. i. අ) මූලික ප්‍රභේද දක්වමින් චෛතසික පිළිබඳ හැඳින්වීමක් කරන්න.
ආ) චිත්ත හා චෛතසික අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව පෙන්වා දෙන්න.
ii. සබ්බචිත්ත සාධාරණ චෛතසික පිළිවෙලින් නම් කර ඒවාට එම නම යෙදීමට හේතුව පෙන්වා දෙන්න.
iii. පුද්ගලයාගේ යහපත් සමාජ පැවැත්ම සඳහා " හිරි" සහ " ඔත්තප්ප" යන කුසල චෛතසිකයන්ගේ ඇති වැදගත්කම උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න.

06. i. අ) චිත්ත වීථීන් හි මූලික ප්‍රභේද දෙක නම් කරන්න.
ආ) චක්ඛුද්වාරික අතිමහන්තාරම්මණ චිත්ත වීථි සටහන ලියා දක්වන්න.
ii. පංචානන්තරිය අකුසල කර්ම නම් කර, ඒවා හා ජවන සිත් අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න.
iii. කාලය අනුව කර්මය විපාක දෙන ප්‍රභේද හඳුන්වන්න. එම ප්‍රභේද හා ජවන සිත්වල ක්‍රියාත්මක වීමේ ප්‍රබලතාව අතර ඇති සම්බන්ධය පෙන්වා දෙන්න.

07. i. අ) " විපල්ලාස" යන්න හඳුන්වන්න.
ආ) විපල්ලාසයන්හි චතුර්විධ ස්වභාවය නම් කරන්න.
ii. "මිච්ඡා පණිහිතං චිත්තං - පාපියෝ නං තතෝ කරේ" යන පාඨයේ අන්තර්ගත අදහස උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
iii. " යෝනිසෝ මනසිකාරය" යන්න හඳුන්වා එය පුද්ගලයාගේ නිවැරදි දැක්මට මඟ පාදන අයුරු පැහැදිලි කරන්න.

08. i. අ) "අනුපූර්ව ශික්ෂණ ක්‍රමය" යන්න හඳුන්වන්න.
ආ) සීල ශික්ෂාවට අයත් මාර්ගාංග නම් කරන්න.
ii. "අනුසය" වශයෙන් පවත්නා කෙලෙස් "වීතික්කම" බවට පත් වීම පාලනය කළ හැක්කේ සීලයෙනි. උදාහරණ සහිතව විමසන්න.
iii. සමාජයේ යහපැවැත්ම සඳහා පුද්ගල සීලයේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

09. i. අ) "නීවරණ" යන්න හඳුන්වන්න.
ආ) නීවරණ පිළිවෙලින් නම් කරන්න..
ii. තෙවැනි සහ සිව්වැනි නීවරණ පිළිබඳව ඒවායේ ලක්ෂණ දක්වමින් උදාහරණ සහිතව වෙන් වෙන්ව කෙටියෙන් සටහන් ලියන්න.
iii. පුද්ගලයාගේ ආධ්‍යාත්මික පරිහානියට නීවරණයන්ගේ බලපෑම සිදුවන ආකාරය පැහැදිලි කරන්න.



Scanned by CamScanner